#ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 1951/3 - 2016 ජනවාරි මස 25 වැනි සඳුදා - 2016.01.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**මුදල් නීති පනත, ලියාපදිංචි ස්කන්ධ හා සුරකුම්පත් ආඥා පනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත**

මුදල් නීති පනත (422 වන අධිකාරය), ලියාපදිංචි ස්කන්ධ හා සුරකුම්පත් ආඥා පනත (420 වන අධිකාරය) හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත (417 වන අධිකාරය) යටතේ මුදල් මණ්ඩලයට පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, මුදල් නීති පනතේ 5 වන හා 86 වන වගන්ති, ඉහත සඳහන් දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත හා ලියාපදිංචි ස්කන්ධ හා සුරකුම්පත් ආඥා පනත යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද 2009.06.24 දිනැති 2009 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියාමනයේ 11 වන නියාමනය හා 2009.06.24 දිනැති 2009 අංක 1 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියාමනයේ 11 වන නියාමනය යටතේ, මුදල් මණ්ඩලය, එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හි කටයුතු සම්බන්ධ බරපතල නියාමන හා අධීක්ෂණ ගැටලු හා එහි දුර්වල ද්‍රවශීලතා තත්ත්වය සැලකිල්ලට ගෙන, මෙරට මුදල්, බැංකු හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය පවත්වාගෙන යාමේ අරමුණින්, 2016 ජනවාරි 04 වන දින සිට බලපැවැත්වෙන පරිදි නැවත දැනුම් දෙන තුරු එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය අත්හිටුවීමට, එම එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හි කළමනාකාරිත්වය ජාතික ඉතිරිකිරීමේ බැංකුවට පැවරීමට හා එම එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස ක්‍රියා කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලක්ෂ්මන් අර්ජුන මහේන්ද්‍රන්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

වර්ෂ 2016 ක් වූ ජනවාරි මස 22 දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

02 - 438

1A - G 22959 — 26 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*